# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## සේවා පැවරුම් පදනම මත තාක්ෂණික නිලධාරී (ශ්‍රව්‍ය දෘශ්‍ය) හා කළමනාකරණ සහකාර තනතුරට බඳවා ගැනීම

මෙම විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ සේවා අවශ්‍යතාවය මත සේවා පැවරුම් පදනම මත තාක්ෂණික නිලධාරී (ශ්‍රව්‍ය දෘශ්‍ය) තනතුර සඳහා සහ කළමනාකරණ සහකාර තනතුර සඳහා බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. සේවා පැවරුම් පදනම මත තාක්ෂණික නිලධාරී (ශ්‍රව්‍ය දෘශ්‍ය)**

**සුදුසුකම් :-**

1. අ .පො. ස. (උ/පෙළ) විභාගයෙන් ඕනෑම විෂය ධාරාවක් යටතේ එක් වරකදී විෂයන් තුනක් (03) සමත් වී තිබිය යුතුය.

සහ

(අ) පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද පනතක් මගින් ස්ථාපිත කර ඇති ව්‍යවස්ථාපිත ආයතනයකින් හෝ තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ඉලෙක්ට්‍රානික හා විදුලි සංදේශ/ඉලෙක්ට්‍රොනික/බහු මාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම 5 වන මට්ටම (N.V.Q. Level 5) හෝ ඊට නොඅඩු ප්‍රවීනතා සහතිකයක් ලබා තිබිය යුතුය.

හෝ

(ආ) පිළිගත් ආයතනයක ශ්‍රව්‍ය දෘශ්‍ය වැඩ පිළිබඳ වසරක පළපුරුද්දක් සමඟ ඉහත (ii) (අ) සුදුසුකම්වලට සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ/ඉලෙක්ට්‍රොනික/බහු මාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණ ක්ෂේත්‍රයේ තාක්ෂණික සුදුසුකම් ලබා තිබිය යුතුය.

**වැටුප :-** රු. 31,625.00 (මූලික වැටුප) + රු. 12,800.00 [551:09(21) පාලක සභා තීරණය ප්‍රකාරව විශේෂ දීමනාව] + රු. 5,000.00 [530:09(17) පාලක සභා තීරණය ප්‍රකාරව විශේෂ දීමනාව]

**බඳවා ගැනීම :-** ලිඛිත හා/හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**වයස :-** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය.

**සේවා පැවරුම් කාලසීමාව :-** මූලිකව මාස 05 කට වන අතර සේවා තත්ත්වය මත සේවා කාලය දීර්ඝ කිරීමට හැකියාව ඇත.

**2. සේවා පැවරුම් පදනම මත කළමනාකරණ සහකාර**

**සුදුසුකම් :-**

1. අ.පො.ස (සා/පෙළ) විභාගයේදී

   i. සිංහල භාෂාව/දෙමළ භාෂාව
   ii. ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය
   iii. ගණිතය

යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06ක් එක් වරකදී සමත් වී තිබීම.

සහ

2. අ.පො.ස (උ/පෙළ) විභාගය එක් වරකදී සියලු විෂයන් සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

3. පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

(අ) පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 06කට නොඅඩු පිළිගත හැකි පරිගණක යෙදුම් පාඨමාලාවක් හදාරා තිබීම.

සහ

(ආ) පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර 02 ක පළපුරුද්ද

**සටහන :-**

(අ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු 30ට නොවැඩි විය යුතුය.

(ඇ) මනා චරිතයකින් යුක්ත විය යුතුයි.

**වැටුප :-** රු. 30,725.00 (මූලික වැටුප) + රු. 12,800.00 [551:09(21) පාලක සභා තීරණය ප්‍රකාරව විශේෂ දීමනාව] + රු. 5,000.00 [530:09(17) පාලක සභා තීරණය ප්‍රකාරව විශේෂ දීමනාව]

**බඳවා ගැනීම :-** ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**සේවා පැවරුම් කාලසීමාව :-** මූලිකව මාස 05 කට වන අතර සේවා තත්ත්වය මත සේවා කාලය දීර්ඝ කිරීමට හැකියාව ඇත.

අයදුම්කරුවන් තම ඉපයීම්වලින් 10% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු අතර, විශ්වවිද්‍යාලය මගින් එකී ඉපයීම් වලින් 15% කට සමාන මුදලක් විශ්වවිද්‍යාලයීය අර්ථසාධක අරමුදලට බැර කරනු ලැබේ. එයට අමතරව 3% ක මුදලක් විශ්වවිද්‍යාලය මගින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට බැර කරනු ලැබේ. එමෙන්ම සේවා අවශ්‍යතාව මත සිදුකරනු ලබන අතිකාල සඳහා යම් සීමාවකට යටත්ව අතිකාල දීමනාවක් ගෙවනු ලැබේ.

**මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කල අයදුම්පත් අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල සහතිකවල සහතික කළ පිටපත් ද සමඟ 2024.08.27 දින හෝ එදිනට ප්‍රථම "සහකාර ලේඛකාධිකාරී, අනධ්‍යයන ආයතන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ"** යන ලිපිනයට ලැබීමට සැලැස්විය යුතු අතර අයදුම්පත බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරෙහි ඔබ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කල යුතුය.

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලි වීම හෝ අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ. කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ යළි සලකා බැලීම සිදු නොකෙරේ. **සේවා පැවරුම් පදනම මත මෙම පත්වීම ලැබීම හේතුවෙන් විශ්වවිද්‍යාලයේ ස්ථිර තනතුරක් ලැබීමට ද හිමිකම් නොලැබේ.**

ලේඛකාධිකාරී